රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SLS 32523/ SLS 32623** – නූතන සිංහල ප්‍රබන්ධකථා

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

කාලය : පැය 03

---

<u>‘අ’ කොටස</u>

01. “මුල්කාලීන ප්‍රබන්ධකථා ‘උපදේශාත්මක ගද්‍ය ආඛ්‍යාන’ ලෙස නම් කිරීම යුක්තියුක්ත ය.” අයිසෙක් ද සිල්වාගේ ප්‍රබන්ධ කෙරෙහි අවධානය යොමු කරමින් යථෝක්ත අදහස පරීක්ෂා කරන්න.

02. “<u>මීනා</u> යනු ස්ත්‍රියකගේ නිදහස් අදහස්වලට මුල් තැන දී රචිත නවකථාවකි.” සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

03. “දේශ වාත්සල්‍යය හා සබැඳි සමාජ සංශෝධනය පියදාස සිරිසේනගේ නවකතාවල දැකිය හැකි මූලික ලක්ෂණය වේ.” විමසන්න.

04. චරිත නිරූපණය, දේශීය ඌරුව සහ සංකේත භාවිතය යන අංග <u>ගම්පෙරළිය</u> නවකථාව සාර්ථක වීමට උපයෝගී වූ ආකාරය පෙන්වා දෙන්න.

05. “කෙටිකතාවකින් අපේක්ෂිත අර්ථය සහ රසය උපදින්නේ, ආඛ්‍යානය ඊට අදාළ පසුතලය තුළ පිහිටුවීමෙන් ම පමණි.” උක්ත ප්‍රකාශය ඔබට අභිමත කෙටිකතා තුනක් ඇසුරෙන් විමසන්න.

212

## 'ආ' කොටස

06. "නවීන සමාජයේ චලිත ජීවන රටාව තුළ සාම්ප්‍රදායික සමාජ සාරධර්ම සහ පුරුෂාර්ථ අනුක්‍රමයෙන් වියැකී යන ආකාරය හෙවනැල්ල නවකථාවෙන් විශද කෙරෙයි." විමසන්න.

07. නවලිබරල්වාදී ස්ත්‍රියකගේ ආගමනය රිදී තිරංගනාව නවකථාවෙහි නිරූපිත ආකාරය විමර්ශනයට බඳුන් කරන්න.

08. මිනිස් චෛතසිකයේ ගූඪබව වැනි සංකීර්ණ උපතේමාවක් සාකච්ඡා කිරීම සඳහා දාරක චරිත යොදා ගැනීමේ අපූර්වත්වය නිර්දිෂ්ට කෙටිකතා දෙකක් ඇසුරෙන් පහදා දෙන්න.

09. කෙටිකතාවක තේමාව වඩාත් අර්ථවත් කිරීම සඳහා නිර්නාමික චරිත භාවිත කිරීමේ උපක්‍රමය කෙතෙක් දුරට සාර්ථක වූයේ දැයි පැරණි මළවුන් තරුණ මළවුන් ට ඉඩදිය යුතුය කෙටිකතාව ඇසුරෙන් පරීක්ෂා කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 16 බැගිනි.)

@@@@@@@@